**ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශය**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වියවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වනනමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.
  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 01 දින සිට සංශෝධිත අයවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර මූලික අයවැයෙහි සඳහන් ආදායම් ඇස්තමේන්තුව සංශෝධනයකර ගැනීමේ හැකියාවක් තිබියදී එසේ සිදුකර නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශය මූලික ආදායම් ඇස්තමේන්තුව වූ රු. 310,000,000 ක වටිනාකම නොවෙනස්ව පැවති අතර රු. 219,000,000 ක සත්‍ය ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර රු. 91,000,000 ක වෙනසක් විය. එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 29 ක් වී තිබීම හේතුවෙන් අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ හා ආදායම් රැස්කිරීමේ කාර්යක්ෂමතාවය සඵලදායීතාවය දුර්වල මට්ටමක පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | වර්ෂය මුල අය විය යුතුව තිබූ හිඟ ආදායම් රු. 347,000,000 ක් අයකරගත යුතු වූ හෙයින් අදාළ ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමේ අවශ්‍යතාවක් පැන නොනගින ලදී. කෙසේ වෙතත් අපේක්ෂිතව තිබුණු ආදායම රැස් නොවූයෙන් මෙම වෙනස පෙන්නුම් කරයි. | වඩා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | ආදායම් සංකේත අංක 2003.07.00 රජයේ වී මිලදී ගැනීමේ වැඩ සටහනේ සමාලෝචිත වර්ෂය අවසානයට 2020 වර්ෂයට අදාළව රු. 12,827,927 ක්ද, 2021 වර්ෂයට අදාළව රු. 124,965,567 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළව රු. 299,292,219 ක්ද වශයෙන් එකතුව රු. 437,085,714 ක හිඟ ආදායම් අයකර ගැනීමට අමාත්‍යාංශය අසමත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රැස්කළ මුළු ආදායම රු. 219,195,185 ක් වූ අතර එය සමස්ත හිඟ ආදායමෙන් සියයට 199 ප්‍රතිශතයක් තවදුරටත් අයකර ගතයුතුව පවතී. ඒ අනුව අමාත්‍යාංශයේ හිඟ ආදායම් රැස්කර ගැනීමේ කාර්යක්ෂමතාවය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ වී මිලදී ගැනීමේ වැඩසටහන කන්න 3 කට අදාළව ක්‍රියාත්මක වූ අතර සියලු කන්න වල හිඟ ආදායම් පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිරන්තරයෙන් දැනුවත්කර ඇත. මේ සඳහා උපදෙස් 2023.02.20 දිනැති DFD/GPPP/MAHA/2022-2023 අංක දරන සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් දැනුවත්කර ඇත. | හිඟ ආදායම් නොපමාව අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් සංකේත අංක 2003.07.00 රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයට අදාළව අයවිය යුතු මුදල වූ රු. 308,968,951 කින් රු. 9,676,732 ක් පමණක් අයකරගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම සියයට 3 ක් වැනි කුඩා ප්‍රතිශතයක් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යක්ෂමතාවය ඉතාම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | 2021 යල කන්නයට අදාළව වී මිලදී ගැනීමේ වැඩසටහන (DFD/paddy/2021/4 අංක දරන චක්‍රලේඛයට අනුව) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 4ක ක්‍රියාත්මක කර පොළොන්නරුව සහ පුත්තලම දිස්ත්‍රික්ක 2 න් එම මුදල අයවීමට ඇත. මේ සඳහා වැඩිදුර උපදෙස් 2023.02.20 දිනැති DFD/GPPP/MAHA/2022-2023 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර ඇත. | වර්ෂයට අදාළ ආදායම් එම වර්ෂය තුළදීම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6.2 දේපළ පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වටිනාකම රු. 69,900,000 ක් වූ වාහන 06 ක් භෞතිකව අමාත්‍යාංශය තුළ නොපවතින බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත්තේ පෙර රාජ්‍ය අමාත්‍යාංශ කෘෂිකර්ම කැබිනට් අමාත්‍යාංශයට ඒකාබද්ධ වීමෙන් අනතුරුව තනි අමාත්‍යාංශයක් වශයෙනි. එබැවින් අනිකුත් අංශ යටතේ පවත්නා වත්කම්ද ඇතුළත් කිරීම නිවැරදි වේ. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් වෙත අනුයුක්ත කර ඇති වාහනද අමාත්‍යාංශය යටතේ ඇතුළත් කිරීමද නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. කෙසේ වෙතත් තව දුරටත් අයිතිය හඳුනාගත යුතු වාහන පිළිබඳ ඉදිරි කටයුතු කෙරෙමින් පවතී. | වාහනය සොයාගෙන එය අමාත්‍යාංශය තුළ උපයෝජනයට හෝ පවතින ආයතනයට පවරාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශයේ භාවිතයේ පවතින KS - 6781 දරන වාහනයේ තක්සේරු වටිනාකම විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. එම වාහනය හා TP-4769 දරන යතුරු පැදිය ඇතුළුව තක්සේරු වටිනාකම්වල එකතුව රු. 179,272,000 ක් වූ වාහන 16 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. කෙසේ නමුත් එම වාහනවලින් 12 ක ලියාපදිංචි අයිතිය කෘෂිකර්ම අමාත්‍යාංශය නමින් නොපවතින අතර එම වාහන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කිරීම හෝ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති හා අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ | වාහන 15 අතුරින් වාහන 06 ක් අමාත්‍යාංශයට පවරාගැනීමට කටයුතු කරමින් පවතී. වාහන 04 ක් පශු සම්පත් අංශයට අයත් බැවින් පවරා ගැනීමක් සිදු කළ යුතු නොවේ. වාහන 04 ක් මේ වන විටද කෘෂිකර්ම අමාත්‍යාංශයට හිමිකාරීත්වය ඇත. මෙම වාහන අතුරින් එක් වාහනයක් අමාත්‍යාංශය සතුව නොමැත. | වාහනවල අයිතිය පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට හෝ වාහන අයිතිය පවතින ආයතන වෙත නැවත භාරදීමට හෝ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශය වෙත නැවත භාරදීමක් හෝ සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | අමාත්‍යාංශයට නීත්‍යානුකූල හිමිකාරීත්වය නොමැති වටිනාකම රු. 24,700,000 ක් වූ වාහන 07 ක් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | වාහන 07 පවරාගැනීම සඳහා අදාළ ආයතන වෙත ඒ බව දන්වා ලිපි යොමුකර ඇත. | වාහනවල අයිතිය පවරාගත යුතුය. |
| (ඈ) | පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශයක් විසින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙන් ලබාගෙන තිබුණ වටිනාකම රු. 6,390,000 ක් වූ PG-1773 අංක දරන වාහනයේ අයිතිය පවරා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | මගේ අංක SML/2/ප්‍ර/2/Ve.Tr/02 හා 2023.03.27 දිනැති ලිපිය මගින් PG - 1773 රථයේ ලියාපදිංචි අයිතිය මෙම අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි පවරා ගැනීම සඳහා අදාළ පැවරුම් පත්‍ර සම්පූර්ණ කර නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ විෂයය පථය වර්තමානයේ අයත් වන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර ඇත. | අයිතිය පවරා ගත යුතුය. |
| (ඉ) | අමාත්‍යාංශය සතු වාහන 08 ක් බාහිර ආයතන වෙත මුදාහැරීමේ පදනම සහ අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවීය. | අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය හා පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශ කටයුතු සඳහා අනුයුක්ත කළ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු එතෙක් භාවිතා කරන ලද නිල රථ දෙකක් හා සංචිත වාහනයක් නව අමාත්‍යාංශයට රැගෙන ගොස් ඇත.මගේ අංක SML/2/ප්‍ර/2/Ve.Assign/III හා 2023.04.27 දිනැති ලිපිය මගින් වාහන 02 නැවත මෙම අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙසත්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි අයිතිය පවතින උක්ත අංක KO – 4865 දරන මෝටර් රථයේ ලියාපදිංචි අයිතිය කර්මාන්ත අමාත්‍යාංශයෙන් විමසා පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ගන්නා ලෙස වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත.<br>KX – 7664 - වාහනය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇත.<br>KX – 8136 - වාහනය නැවත මෙම අංශය වෙත භාරදීමට කටයුතු කරන ලෙස මගේ අංක SML/02/ප්‍ර/ Ve.Assign-අමාත්‍ය හා 2022.10.18 දිනැති ලිපිය මගින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත.<br>KO – 0024 - පූර්වගාමීව පැවති ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතේ එම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක | අමාත්‍යාංශය සතු වාහන බාහිර ආයතන වෙත මුදා නොහැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | MREA/2/ප්‍ර/2/Ve.Tr/03-1 හා 2018.01.09 දිනැති ලිපිය මගින් මෙම ජීප් රථය මෙම අංශය වෙත භාරදීමට කටයුතු කරන්නේ ද නැතහොත් රා.මු.ච 01/2020 හි 8 වගන්තිය යටතේ වන විධිවිධාන අනුව කටයුතු කරමින් වාහනයේ තක්සේරු වටිනාකම මෙම අමාත්‍යාංශය වෙත ගෙවීම් කර රථයේ ලියාපදිංචි අයිතිය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගැනීම සිදු කරන්නේ ද යන්න පිළිබඳව දැනුම් දෙන ලෙස මගේ අංක SML/2/ප්‍ර/2/Ve.Tr/03-1 හා 2023.04.10 දිනැති ලිපිය මගින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත දැනුම් දී ඇත.<br>CAA – 0024 – මෙම රථය නැවත මෙම අංශය වෙත භාර දෙන ලෙස මගේ SML/2/ප්‍ර/2/පැවරීම්/05 හා 2022.09.22 දිනැති ලිපිය මගින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවි බල ගැන්වීම් අමාත්‍යාංශයට රැගෙන ගොස් පසුව මුදල් අමාත්‍යාංශය වෙත මෙම ජීප් රථය රැගෙන ගොස් ඇත.ඒ අනුව මගේ අංක SML/2/ප්‍ර/2/පැවරීම්/05 හා 2022.11.22 හා 2022.04.06 දිනැති ලිපි මගින් මෙම ජීප් රථය නැවත මෙම අංශය වෙත භාරදීමට කටයුතු කරන ලෙස මුදල්,ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත. CAH – 1634 - ජීප් රථය තාවකාලිකව වී අලෙවි මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇත. | |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පශු සම්පත් අංශයට හිමිකාරීත්වය ඇති එකතු වටිනාකම රු. 139,800,000 ක් වූ වාහන 08 එම අංශයේ හෝ අමාත්‍යාංශයේ වෙනත් අංශයක හෝ භෞතිකව නොපවතින අතර ඒවා ආපසු ලබා ගැනීම සිදුකර නොතිබුණි. | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ පහත් බිම් හා වෙරළ සංරක්ෂණ අංශය යටතේ KX 8136 අංක දරන ජීප් රථයද, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ මුදල් ගරු රාජ්‍ය අමාත්‍යතුමන්ගේ නිල රථයක් වශයෙන් CAA - 0024 ජීප් රථය ද භාවිතා කරන බැවින් ඒවා නැවත භාරදෙන ලෙස දැනුම් දී ඇති නමුත් මෙතෙක් නැවත භාර දීමට කටයුතු කර නොමැත. | වාහන ආපසු අමාත්‍යාංශය වෙත ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශය විසින් කර්මාන්ත අමාත්‍යාංශයට අයත් අංක KK - 5865 දරන වාහනය 2019 ජනවාරි 10 දින සිට භාවිතා කර ඇති නමුත් 2023 අප්‍රේල් 25 දින දක්වා එය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත රථය පැවරීමට එකඟතාවය ලබා දෙන ලෙස කර්මාන්ත අමාත්‍යාංශයෙන් 2021.03.24 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති නමුත් මෙතෙක් ඒ සඳහා එකඟතාවය පළ කර නැත. | වාහනය පවරාගැනීමට හෝ අයිතිය ආයතනයට පවරාදීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මු.රෙ.128 (2) (ඇ), මු.රෙ.176 (1) අංක 01/2015 දරන 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 ඡේදය පරිදි අංක 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා එකී කාලසීමාව අවසන් වී මාසයක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂවරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, 2022 වර්ෂයට අදාළව එම වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | අමාත්‍යාංශයේ ආදායම් ගණන් දීමේ නිලධාරියා වශයෙන් ආදායම් ශිර්ෂය 2003.07.00 හි අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | අර්ධ වාර්ෂිකව හිඟ ආදායම් වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2022 ඔක්තෝබර් 01 දින සිට අහෝසි වී ගිය රාජ්‍ය අමාත්‍යාංශ 03 හි කටයුතු කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ආර්ථික අංශය, පොහොර අංශය හා පශු සම්පත් අංශය වශයෙන් ක්‍රියාත්මක වුවත් මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් බලතල පැවරීමක් සිදුකර තිබුණු බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවීය. | මෙම අංශ 2 හි 2022 ඔක්තෝම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය මාස 03 ක් වැනි කෙටි කාල සීමාවක් බැවින් පැවති අමාත්‍යාංශයේ මූල්‍ය බලතල පැවරීම ප්‍රකාරව කටයුතු පවත්වා ගෙන යන ලද බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය බලතල පැවරීමක් සිදුකළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 3.4 ඡේදය ප්‍රකාරව එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු එස්ඒ-2 (ii) ආකෘතියේ දැක්විය යුතුය. නමුත් අමාත්‍යාංශයේ එස්ඒ-2(ii) අකෘතියේ එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම උක්ත පරිදි කටයුතු නොකර වැය විෂය සංකේතාංක දෙකක් එකතු කරමින් මුළු ශුද්ධ ප්‍රතිපාදනය, සත්‍ය වියදම හා වෙනස සඳහන් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/5 අනුව ACA 2(ii) වියදම් ප්‍රකාශය සඳහා සපයා ඇති ආකෘතියේ තොරතුරු ඉල්ලා ඇත්තේ ව්‍යාපෘති අනුව වියදම් ප්‍රකාශය නොව වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයයි. එබැවින් අදාළ ආකෘතිය ප්‍රකාරව වියදම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | මු.රෙ 891(i) | ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැන්පත් කළ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනයත් මේ වනවිට පිළියෙල කර ඇත. | ඇප ලේඛනයක් පිළියෙල කළ යුතුය. |
| (ආ) | මු.රෙ.1646 | වාහනවල ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත් හා ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2022 වර්ෂයට අදාළව නිල හා සංචිත වාහනවල ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එම වර්ෂයට අදාළ ධාවන සටහන් පරීක්ෂා කර විගණනයට ඉදිරිපත් කිරීම 2022 වර්ෂයේ දී ද සිදු කිරීමට නියමිත වූ බැවින් 2022 වර්ෂයේ සංචිත වාහන ධාවන සටහන් නියමිත දිනට විගණනයට ලබා දීම ප්‍රමාද වූ බව පිළිගනිමි. | වාහනවල ධාවන සටහන් හා සාරාංශ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද මු.රෙ. 770 (4) හා 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ අංක 02 (අ) වගන්තිය | අමාත්‍යාංශයේ පශු සම්පත් අංශයේ ධාවන තත්වයේ නොපවතින වාහන 2020.12.31පෙර අපහරණය කළ යුතු බවත් අයවැය ප්‍රතිපාදන හෝ පළාත් සභා අරමුදල් භාවිත කරන ආයතන එම වාහන අපහරණය කිරීමෙන් උපයාගත් මුදල් අදාළ අරමුදලට බැර කළ යුතු බව දක්වා තිබුණ ද අපහරණ කමිටුව විසින් අපහරණය සඳහා නිර්දේශ කර තිබියදී 2022 මාර්තු 01 දින වන විටත් අපහරණය කර නොතිබුණි. | අංක 65 - 6120 දරන රථය 2015 සැප්තැම්බර් මාසයට පෙර පැවති ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ තිබී පසුව 2015 සැප්තැම්බර් මස ස්ථාපිත කරන ලද පූර්වගාමීව පැවති ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයට ඒකාබද්ධ වීමෙන් පසුව (ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය අහෝසි වූ බැවින් ) මෙම රථය ග්‍රාමීය ආර්ථික පිළිබඳ අමාත්‍යාංශයට අයත් වී ඇත. එම අවස්ථාවේදී ද රථය ධාවන තත්ත්වයෙන් නොතිබී ඇති අතර, පෙර පැවති ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් මෙම රථයට අදාළ ලිපි ගොනු භාරදීමක් සිදු කර නොමැත. රථය ධාවන තත්ත්වයේ නොතිබුණු බැවින්, පසුකාලීන අමාත්‍යාංශ යටතේ මෙම වාහනයට අදාළව ලිපි ගොනුවක් නඩත්තු කර නොමැත. | වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 94(1) ප්‍රකාරව ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳිය නොහැකි වුවද, අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය විසින් වැය විෂයයන් 18 ක ඉතිරිවීම් ඉක්මවා රු. 2,312,760,277 ක බැරකම් සඳහා බැඳීම් ඇතිකරගෙන තිබුණි. | එළඹෙන වර්ෂයේදී ගෙවීමට ඉදිරිපත්වීමට නියමිත බිල්පත් වෙනුවෙන් වූ ප්‍රතිපාදන මාරුකර ගැනීමක් මගින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු නොකළ අතර හැකිතාක් උපයෝජනය වන ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන සලසා ගන්නා ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් හා බැරකම් ඇතිකර නොගත යුතුය. |
| (ආ) | කෘෂිකර්ම අංශය වර්ෂයට අදාළ රු.3,585,762 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් හා බැඳීම් ප්‍රකාශයේ සටහන් අංක (iii) යටතේ ඇතුළත් කර නොතිබුණි. | එම බැරකම් ඇතුළත් කිරීමට නොහැකි වී ඇත්තේ අදාළ බිල්පත් පසුව ඉදිරිපත් වන බැවිනි. කෙසේ නමුත් ඉදිරියේ දී බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා සිටිමි. | සියලුම බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 6 වැනි ඡේදයේ සඳහන් ඇමුණුම (iii) අනුව පිළියෙල කළ යුතු බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට අමාත්‍යාංශයට අදාළ සියලුම බැඳීම් හා බැරකම් ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේ දී බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම බැඳීම් හා බැරකම් ඇතුළත් කළ යුතුය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 371(2) ප්‍රකාරව නියමිත කාර්යය අවසන් කළ වහාම ලබාගත් අත්තිකාරම් පියවීම කළයුතු වුවත් කෘෂිකර්ම අංශයේ නිලධාරීන් 06 දෙනෙකු ලබාගත් එකතුව රු. 228,080 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 30 සිට දින 116 දක්වා කාල පරාසයක්ද පශු සම්පත් අංශයේ නිලධාරීන් 09 දෙනෙකු ලබාගෙන තිබුණු එකතුව රු. 156,024 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 50 සිට දින 240 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී අදාළ කාර්යය ඉටු වූ වහාම පියවන ලෙස නිරන්තර දැනුවත් කිරීම් කර ඇති අතර, අවස්ථානුගතව පැන නැගුණු දුෂ්කරතා මත ඇතැම් ඒවා පියවීම ප්‍රමාද වී ඇත.අදාළ අත්තිකාරම් කඩිනමින් පියවා ගැනීමට උපදෙස් ලබා දී ඒ අනුව කටයුතු කරනු ලැබේ. | අදාළ කාර්යය නිමකළ වහාම තත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතුය. |

## 2.6 තැන්පත් ශේෂ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පත් ගිණුම් පවත්වා ගැනීමට අදාළව පොහොර අංශයේ 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවූ රු.126,000 ක තැන්පතුවක්ද පශු සම්පත් අංශයේ වර්ෂ 02 ඉක්මවූ රු. 440,439 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් ද මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩලයේ කාර්යාල අලුත්වැඩියාව සඳහා 2020 දෙසැම්බර් මස Kinwes Private Limited වෙත ගෙවීම් කිරීමේදී රැඳවුම් ගාස්තු ලෙස රඳවා ගත් මෙම මුදල ගෙවීම සඳහා මෙතෙක් බිල්පත් ඉදිරිපත් නොවිය. බිල්පත් ඉදිරිපත් වූ වහාම ගෙවීමට කටයුතු කර මු.රෙ.571 ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. මෙතෙක් රාජ්‍ය අදායමට බැර නොකළ රු.440,439.00 ක මුදල නියමිත පරිදි ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | තැන්පතු නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන්නේනම් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ අංක BDKBP/01/01/03-2023 දරන 2022 දෙසැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛයේ 18 වැනි වගන්තිය ප්‍රකාරව අහෝසි වී ගිය වැය ශීර්ෂවලට අදාළ අක්‍රීය නිල බැංකු ගිණුම් සහ අනුමත අග්‍රිම ගිණුම් වසා දැමීමේ කාර්යයයේ වගකීම අහෝසි වූ අමාත්‍යාංශවල සේවය කළ ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී වෙත පවරා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ අහෝසි වූ වැය ශීර්ෂ 407,426 හා 427 වලට අදාළ රු.50,917,244 ක ශේෂයන් ඇතුළත් නිල බැංකු ගිණුම් 03 ක් මෙම වාර්තාවේ දිනය දක්වාම වසා දැමීමට කටයුතුකර නොතිබුණි. | පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ඒකාබද්ධ කර අතර එකී රාජ්‍ය අමාත්‍යාංශයන් අංශ වශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව එක අග්‍රිම ගිණුමක් යටතේ වෙන් වෙන් අංශ වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන බව දන්වමි. | අහෝසි වූ අමාත්‍යාංශවල බැංකු ගිණුම් වසා දැමිය යුතුය. |

## 2.8 පාඩු හා අත්හැරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශය මුදල් රෙගුලාසි අනුව වාහන අනතුරු සඳහා අයවිය යුතු රු. 114,343 ක අලාභය වගකිව යුතු රියදුරන් දෙදෙනෙකු වෙතින් අය කරගෙන නොතිබුණි. එම රියදුරන් අමාත්‍ය | වාහන අනතුරු සම්බන්ධයෙන් රියදුරන් දෙදෙනෙකුගෙන් අයවීමට තිබූ මුළු මුදල රු.282,371 ක් වේ. එම මුදලින් 2022.04.30 දින වන විට රු.168,028 ක මුදලක් අයකරගෙන තිබූ අතර 2022 අප්‍රේල් 17 න් පසු හිටපු ගරු අමාත්‍ය තුමා සමඟම එම රියදුරන් දෙදෙනා තනතුරු වලින් ඉවත් වූ බැවින් | නොපමාව සිදුව ඇති අලාභය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යය මණ්ඩලයෙන් ඉවත් වී තිබුණද අයකර ගත යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තවදුරටත් අයවිය යුතු රු.114,343 ක මුදල අයකර ගැනීම ගැටළු සහගත තත්වයක් උදාවිය. එම අලාභය කඩිනමින් ගෙවන ලෙස රියදුරන් දෙදෙනාට ලිපි 02ක් යොමු කර ඇතත්, මේ දක්වා ප්‍රතිචාර දක්වා නොමැත.<br>මෙම රියදුරන් දෙදෙනා දැනට ලංකාවේ නොමැති බවට ආරංචි මාර්ගයෙන් දැනගැනීමට ලැබී ඇති අතර මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී මාර්ගයෙන් තොරතුරු සොයාගෙන ඉදිරියේදී වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරමින් පවතී. | |
| (ආ) | ලියාපදිංචි අංක KY - 5535 හා CAV – 5064 දරන වාහන 02 ට සිදුවූ අනතුරු හේතුවෙන් රු. 7,982,290 ක අලාභය තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය තුළ ඇතුළත් කර නොතිබුණි. | KY 5535 - මෙම වාහනයේ රු. 303,971 ක මුදල 2021 වර්ෂයේ කපාහැර වටිනාකම් ලැයිස්තුවට ඇතුළත් කර ඇත.<br>CAV 5064 - මෙම වටිනාකම තව දුරටත් අයකර ගැනිමට ඇති ලේඛනයට ඇතුළත් කිරිමට කටයුතු කරන බව දන්වමි.<br>CAV 5064 - මේ සම්බන්ධයෙන් තවමත් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. අතපසුවීමකින් මගහැරුණු වටිනාකම් ඉදිරියේදී ඇතුළත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දුර්වලතා

#### 3.1.1 කුලී ගිවිසුම අවසන් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 අප්‍රේල් 08 දින සිට 2021 අප්‍රේල් 07 දින දක්වා වර්ෂ 05 ක කාල සීමාවක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට පෞද්ගලික සමාගමකින් ඩීපීජේ ටවර්ස් නැමැති ගොඩනැගිලි පරිශ්‍රය කුලියට ලබාගෙන නැවත එය බදු දීමනාකරුට 2020 ජනවාරි 31 දින භාර දී තිබුණි. අමාත්‍යාංශය විසින් එම බදු දීමනාකරු වෙත ගෙවන ලද රු. මිලියන 63 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල මේ දක්වා අයකර ගෙන නොතිබුණි. තවද බදු දීමනාකාර පාර්ශවය විසින් මෙම තැන්පතු මුදල නීති විරෝධී ලෙස | ගිවිසුම ප්‍රකාරව දේපලේ නිරවුල් භුක්තිය 2020 ජනවාරි 31 දින භාර දීමෙන් අනතුරුව තැන්පත් මුදල් බදු ගැනුම්කරු වෙත ආපසු ගෙවිය යුතු වේ. නමුත් රුපියල් මිලියන 63 ක තැන්පතු මුදල එකඟ වූ පරිදි DPJ ආයතනය නොගෙවූ අතර අවස්ථා කිහිපයකදීම DPJ ආයතනය වෙත ලිඛිතව දැනුම් දුන් අතර ඔවුන් ද ඊට ප්‍රතිචාර දක්වා ඇත.<br>නමුත් එකී පාර්ශවයන් ඉදිරිපත් කර ඇති කරුණු පිළිගත නොහැකි බැවින් තැන්පත් මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමට අමාත්‍යාංශයට සිදුව ඇත.<br>ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව DPJ ආයතනය වෙත එන්තරවාසි යවා ඇත. එම එන්තරවාසියට පිළිතුරු වශයෙන් 2022.11.21 දින දරන ලිපිය මගින් ඔවුන් රු.ලක්ෂ 300ක මුදලක් ගෙවීමට එකඟ වී | තැන්පතු මුදල අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රඳවා තබාගෙන මේ දක්වා වසර 02 ක කාලයක් ඉක්මවා ගොස් ඇති බවද නිරීක්ෂණය කෙරේ. | ඇත. එම එකඟ වූ මුදල අයකර ගැනීමටත් ඉතිරි මුදල සඳහා නඩු පැවරීමටත් නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අපේක්ෂාවෙන් සිටී. | |
| (ආ) | බදු කුලී ගිවිසුම අවසානයේදී දෙපාර්ශවයේ එකඟත්වය ඇතිව අලාභ හානි පිළිබඳ වාර්තාවක් කැඳවිය යුතු බවට අදාළ බදු ගිවිසුම තුළ කොන්දේසියක් ඇතුළත් නොවීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් එම බදු දේපලට සිදු වී ඇති හානිය රු. 12,710,236 කටත් බදු දීමනාකාර සමාගම විසින් එම හානිය රු. 28,250,056 කටත් තක්සේරු කර ඇත. අදාළ ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය ගණනය කර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් වාර්තාවක් ලබා ගැනීම මේ දක්වා ප්‍රමාද වී ඇත. | බදු ගිවිසුම අවසන් වී ගොඩනැගිල්ල භාරදීමට ප්‍රථම ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය හඳුනාගෙන ඒ සඳහා හානිය ගණනය කිරීමට සුදුසු ආයතනයක් වෙත භාරදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා DPJ ආයතනයට අමාත්‍යාංශය හා එක්ව එම පරීක්ෂාව සිදු කිරීම සඳහා සහභාගී වන ලෙස දැනුම් දුන්න ද එම ආයතනය එම අවස්ථාවට සහභාගී නොවූ බැවින්, අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය මගින් සිදු වී තිබූ හානිය හඳුනාගෙන ඒ සඳහා දල ඇස්තමේන්තුවක් සකස් කරන ලදී. අනතුරුව DPJ ආයතනය විසින්ද හානිය ගණනය කර වාර්තාවක් ඉදිරිපත් කර ඇති බැවින්, එම වාර්තා දෙක අතර මතභේදාත්මක තත්වයක් ඇති විය. එබැවින්, මෙම ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය ගණනය කර වාර්තාවක් ලබාදීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ලබන වාර්තාවට අනුව ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය සඳහා ගෙවීම් සිදුකරන බැවින්, අමාත්‍යාංශය හෝ DPJ ආයතනය විසින් ලබා දී ඇති වාර්තාවන් මත පදනම්ව වැඩිපුර ගෙවීමේ අවධානමක් පිළිබඳව නිගමනය කළ නොහැකිය. | ගොඩනැගිල්ලට සිදුවූ හානිය තක්සේරු දෙපාර්තමේන්තුව ලවා ස්වාධීනව තක්සේරු කරවා ගත යුතුය. |

### 3.1.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අය නොවූ ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 485(4) හා මු.රෙ. 113(6)(අ) පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තුන් මසක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, ස්ථාන මාරු වී ගිය නමුත් 2022 දෙසැම්බර් 31 දිනට එම ණය ශේෂයේ වටිනාකම රු. 229,350 ක් විය. | එම ශේෂයට අදාළව කෘෂිකර්ම අංශයේ නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 229,350 ශේෂයෙන් රු.12,150 ක මුදලක් 2023 මැයි මස නිරවුල්කර ඇති අතර ඉතිරි මුදල ඉදිරියේදී නිරවුල්කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවය හැරගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු. 140,557 ක ණය ශේෂය වර්ෂ 05 කට වඩා පැරණි වූ අතර වර්ෂ 3-4 අතර කාලයට අයත් නිලධාරීන් 04 දෙනෙකුගේ රු. 427,933 ක හිඟ ණය ශේෂයක්ද විගණනයේදී නිරීක්ෂණය විය. | සේවය හැර ගිය වර්ෂ 05 ට වඩා වැඩිවූ අය විය යුතු ණය ශේෂ එකතුව රු.140,557 කි. කෘෂිකර්ම අංශයට අදාළ නිලධාරියාගේ ණය ශේෂය සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත යොමුකර ඇත. පශු සම්පත් අංශයට අදාළ නිලධාරීන්ගේ ණය ශේෂ කපා හැරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත අයදුම්පත් යොමුකර | හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇත. ඉදිරියේදී මෙම ණය ශේෂ ගිණුම් වලින් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.සේවය හැර ගිය වර්ෂ 3-4 අතර කාලයට අයත් නිලධාරීන්ගේ ණය ශේෂයන්ගේ එකතුව රු.443,148 කි. | |
| (ඇ) | වැඩ තහනම් කළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.537,149 ක ණය ශේෂ එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. | මෙම ණය ශේෂය තුළ එක් නිලධාරියෙකුගේ රු 175,714 ක ණය ශේෂයක් අයකර ගැනීමට ඔහුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති ලිපිනයට ලිපි යොමු කළද එම ලිපිනයේ නොමැති බව තහවුරු වීම නිසා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ලිපි යොමු කර ඇත.නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙතද යොමු කර ඇති අතර ණය ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.ඉතිරි ණය ශේෂය පොහොර අංශයට අදාළ නිලධාරීන් 03 සඳහා වන රු 361,435 ක් වන අතර එම නිලධාරීන්ටද ණය අයකර ගැනීම සඳහා ලිපි මගින් දැනුවත් කිරීම් කර ඇත. ණය ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල අගය රු. 603,099 ක් වූ අතර එම ණය ශේෂ මාස 03 සිට වර්ෂ 03 දක්වා වන කාල පරාසයකට අයත් ඒවා බවට නිරීක්ෂණය විය. | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂය රු. 603,099 කි. විශ්‍රාම පාරිතෝෂිකය මෙතෙක් ගෙවා නොමැති අතර විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමෙන් පසු ණය ශේෂ ගිණුම් සාරාංශය මගින් නිරවුල් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව පශු සම්පත් අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට යාවත්කාලීන කරන ලද ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම යන තොරතුරු ඇතුළත්කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සංවර්ධන වැඩසටහන ව්‍යාපෘතිය යටතේ ඇති එක් එක් ක්‍රියාකාරකම් සඳහා කාර්තුමය වශයෙන් මූල්‍ය අවශ්‍යතාවය ක්‍රියාකාරී සැලැස්ම තුළම අන්තර්ගත වේ. එබැවින් අක්මුදල් අවශ්‍යතා සැලැස්මක් වෙනමම ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී. මේ වසරේ සිට වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතුකර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළයුතු සියලු තොරතුරු ඇතුළත් කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | | | |
|---|---|---|---|
| (අ) | 2020 නොවැම්බර් 16 දිනැති අංක අමප/20/1626/323/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා පොහොර සමාගම සතු රසායනාගාරය ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත වැඩි දියුණු කර පවරා ගැනීම සඳහා 2021 හා 2022 අයවැය මගින් පිළිවෙලින් මිලියන 19 ක් හා මිලියන 20 ක් ලෙස එකතුව මිලියන 39 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. එහෙත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එකී රසායනාගාරය පවරා ගැනීම හෝ වැඩි දියුණු කිරීම සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 39 ක ප්‍රතිපාදන උපයෝජනය නොවී ඇති අතර 2021 හා 2022 වර්ෂයන්හිදී ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් සිදු කළ යුතු රසායානගාර පරීක්ෂණ පෞද්ගලික රසායනාගාර වෙත යොමු කිරීමට සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | ලංකා පොහොර සමාගම සතු රසායනාගාරය ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමෙන් ඇතිවන ආර්ථික ප්‍රතිලාභ හා පවරාගැනීමට වැය වන පිරිවැය ඇතුළු මුදල් අමාත්‍යවරයා විසින් ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ආයතන නියෝජනය කරමින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ඇතිව පත් කරන ලදී.<br>ලංකා පොහොර සමාගමට අයත් රසායනාගාරය ජාතික පොහොර ලේකම් කාර්යාලය පවරා ගැනීම සුදුසු නොවන බව තීරණය වූ පසු විකල්ප මාර්ග සොයා බැලීම සඳහා 2021.09.22 දින කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ පැවති රැස්වීමක දී ලබා ගත් තීරණය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර නැනෝ තාක්ෂණික ආයතනය හා ජීව තාක්ෂණික ආයතනය සමග සහයෝගී රසායනාගාරයක් පවත්වාගැනිමේ හැකියාව සොයා බැලීම, ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීම සඳහා හා රසායනාගාරයක් පවත්වාගැනීමේ දී නෛතික අවශ්‍යතා සොයා බැලීම සඳහා ගිවිසුමේ කෙටුම්පතක් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ලේකම්, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට යොමු කළ නමුත් එම අමාත්‍යාංශයට ඉහත සඳහන් ආයතන අයත් නොවන බව දැනුම් දුන් බැවින් නැවත එවකට පැවති ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපත් සහිතව ලේකම්, තාක්ෂණ අමාත්‍යාංශය වෙත දැනුම් දීමක් සිදු කළ නමුත් අමාත්‍යාංශවල සිදු වූ වෙනස්කම් සමග එම ක්‍රියාවලිය සාර්ථක නොවිණි. | ලංකා පොහොර සමාගම සතු රසායනාගාරය ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත පවරාගෙන වැඩි දියුණු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව සත්ව පාලන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 808 ක්ද, භෝග වගා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 15,414 ක්ද ලෙස සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 16,222 ක් විය. ව්‍යාපෘතිය යටතේ හඳුනාගනු ලැබූ නිශ්චිත ප්‍රතිලාභීන් වෙතට ප්‍රතිලාභ ලැබුණේද යන්න තහවුරු කර නොගෙන ප්‍රතිලාභී නාම ලේඛන මත පදනම්ව පමණක් ව්‍යාපෘතියේ ප්‍රගතිය හඳුනා ගැනීමට කටයුතු කර තිබුණි. | එක් එක් ක්ෂේත්‍ර සඳහා කටයුතු කරනු ලබන අදාළ දිස්ත්‍රික්ක වල නිලධාරීන් විසින් සහතික කරන ලද ප්‍රතිලාභී ලේඛන සඳහා අනුමැතිය ලබාදීමෙන් පසු ප්‍රතිපාදන මුදාහැරීමට කටයුතු කර ඇත. ප්‍රතිලාභීන් වෙත ප්‍රතිපාදන ලබා දීමේ දී, වර්තමානයේ ලිපිද්‍රව්‍ය වල පවතින හිඟය සැලකිල්ලට ගනිමින් ලබාගත් තහවුරු කිරීමේ ලේඛන වල පිටපත් ගෙන්වා ගැනීමක් සිදු නොකළ අතර එම ලේඛන අදාළ ප්‍රාදේශීය කාර්යාල සතුව පවතී. | නිශ්චිත ප්‍රතිලාභීන් වෙතට ප්‍රතිලාභ ලැබුණේද යන්න තහවුරු කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ග්‍රාමීය ආර්ථික අංශයේ අතිරේක ලේකම්ගේ 2022 ජූනි 10 දිනැති අංක 02/2022 දරන චක්‍රලේඛය අනුව ප්‍රතිලාභියෙකු ලෙස තෝරාගත යුත්තේ යෝජිත වර්ෂයට ආසන්න වර්ෂ 02 තුළ රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් උඳු හෝ මුං වගාව සඳහා සහනාධාර නොලැබූ පවුලක් විය යුතු බව දක්වා තිබියදී 2021 වර්ෂයේ තෝරාගත් ඇතැම් ප්‍රතිලාභීන් 2022 වර්ෂයේද තෝරාගෙන තිබුණු අවස්ථා 11 ක් නිරීක්ෂණය විය. | සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේදී සිදු කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලිඛිතව දැනුම් දී ඇති අතර ඉන් බැහැරවීමක් සිදුව ඇති බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල අයත් දිස්ත්‍රික් ලේකම් වරුන් මගින් එම ප්‍රාදේශීය කාර්යාල වලින් කරුණු විමසීම සඳහා ලිඛිත දැනුම් දීම් සිදු කර ඇත. | ප්‍රතිලාභීන් ලෙස යෝජිත වර්ෂයට ආසන්න වර්ෂ දෙක තුළ රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් උඳු හෝ මුං වගාව සඳහා සහනාධාර නොලැබූ පවුල් තෝරාගත යුතුය. |
| (ඈ) | ග්‍රාමීය ආර්ථික අංශයේ 2021 අගෝස්තු 31 දිනට සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉන්දීය රජයේ ආධාර යටතේ ඇස්තමේන්තු වටිනාකම රු. 2,000,000,000 ක් වූ සනීපාරක්ෂක ඒකක 3,400 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද 2023 අප්‍රේල් 25 දින දක්වා ව්‍යාපෘති කටයුතු ආරම්භ කර නොතිබුණි. උක්ත ව්‍යාපෘතිය සංශෝධනය කිරීමට අදාළ කාර්යයන් 2022 කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර තිබුණු අතර “සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම මගින් නිරෝගිමත් ජනතාවක් ඇති කිරීමට පියවර ගැනීම” අංශයේ අරමුණක් ලෙසද සඳහන් කර තිබුණි. නමුත් උක්ත ව්‍යාපෘතිය සංශෝධනය කිරීමට අදාළ කාර්යයන් 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | ඉන්දියානු රජය සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය අතර මූලික අවබෝධතා ගිවිසුම (MoU) 2018.07.19 දින සිට 2021.07.18 දක්වා වලංගු වන පරිදි අත්සන් තබා ඇත. නව අමාත්‍යාංශය වෙත පැවරීමෙන් පසු පෙර අමාත්‍යාංශය විසින් කර තිබූ ලංසු කැඳවීම් සඳහා ඇගයීම් සිදු කළද එක් සනීපාරක්ෂක ඒකකයක් ඉදිකිරීම සඳහා සකසා තිබූ ඇස්තමේන්තු මිල ගණන් යටතේ වර්තමාන මිල ගණන් වල වෙනස්වීම අනුව කිසිදු ආයතනයක් ඉදිරිපත් නොවීම හේතුවෙන් වර්තමාන මිල ගණන් සැලකිල්ලට ගනිමින් නැවත ඇස්තමේන්තු සකස් කිරීමට තීරණය විය. ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශ ලබා ගැනීමට සිදු වූ බැවින් යම් කාලයක් ගතවූ අතර මේ හේතුවෙන් මූලික අවබෝධතා ගිවිසුමේ කාලසීමාව ඉකුත් විය. මෙම කරුණු හේතුවෙන් 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොතිබුණි.<br>එසේම, 2022 වර්ෂය සඳහා අය වැය ප්‍රතිපාදන මගින් සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබීම හේතුවෙන් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට මෙම කාර්යය ඇතුළත් නොකරන ලදී. | ව්‍යාපෘතිය යටතේ ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුය. |
| (ඉ) | පශු සම්පත් අංශයේ අභිජනන ගොවිපලවල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ රජයේ අභිජනන ගොවිපලවල් 09ක් හා පෞද්ගලික අභිජනන ගොවිපලවල් 25ක් ඉදිකිරීම සඳහා 2022 වර්ෂය තුළ පිළිවෙලින් රු. 15,900,000 ක් හා රු.6,250,000 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණද | 2022 වර්ෂය අවසාන වන විට නිම කිරීමට සැළසුම් කරන ලද රජයේ අභිජනන ගොවිපොළ 09 න් 02 ක වැඩ නිමකර නියමිත ගෙවීම් සිදු කර ඇත.පෞද්ගලික අභිජනන ගොවිපොළ 28 ක් ද, රජයේ අභිජනන ගොවිපොළ 02 ක් (උතුරු සහ වයඹ පළාත්) ද වශයෙන් සමස්ත අභිජනන ගොවිපොළ 30 ක වැඩ නිම කර නියමිත ගෙවීම් සිදු කර ඇත. 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක | අපේක්ෂිත කාර්යය සාධන මට්ටම ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසාන වන විට පෞද්ගලික අභිජනන ගොවිපලවල් 28ක් ඉදිකර තිබුණු අතර රජයේ අභිජනන ගොවිපලවල් 02 ක් පමණක් ඉදිකර තිබිණි. | කිරීමේ ක්‍රමවේද සැලසුම් කිරීම, ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම්, පළාත් මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම හා ප්‍රතිලාභීන් තෝරා ගැනීම් ආදී මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින අතර නිකුත් වූ 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලදී. මුළු වර්ෂය සඳහාම වෙන් වූ ප්‍රතිපාදන වැය කරමින් නැවත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ වූයේ සිවුවන කාර්තුවේ දී ය. එබැවින්, ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් රජයේ අභිජනන ගොවිපොළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දකුණු, සබරගමුව, මධ්‍යම, බස්නාහිර, ඌව සහ නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන් විසින් දන්වා ඇත. | |
| (ඊ) | පශු සම්පත් අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයින් සංවර්ධනය හා කිරි පොකුරු ගම්මාන සංවර්ධන වයාපෘතිය යටතේ ප්‍රතිශෝධිත අයවැය අනුව රු.32,000,000 ක මූල්‍ය ප්‍රතිපාදනයක් ලබාදී තිබුණු අතර සියයට 93ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන තිබුණද සැලසුම්ගත ක්‍රියාකාරකම් 05ක් සම්බන්ධයෙන් භෞතික ප්‍රගතිය අත්කර ගැනීම සියයට 2ත් 3ත් අතර වූ අවම මට්ටමක පැවතුණි. රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධ 2022.04.26 දිනැති හා අංක 03/ 2022 දරන ජාතික අය වැය චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණු අතර දරන ලද පිරිවැය නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | 2022 අයවැය අනුව පශු සම්පත් සංවර්ධනය සඳහා රු.1000,000,000 ක් ප්‍රතිපාදන වෙන් කිරීම මත කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයින් සංවර්ධනය හා පොකුරු කිරි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සියලුම පළාත් ආවරණය වන පරිදි දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. එහිදී ව්‍යාපාතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් 05ට අදාළ ඉලක්ක කාර්තු 04 ට බෙදා ක්‍රියාත්මක කරන ලදී. රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධ 2022.04.26 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ අංක 03/ 2022 ට අනුව ව්‍යාපෘතියෙහි කටයුතු සම්පූර්ණයෙන්ම නවත්වන ලදී. පළමු කාර්තුව තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද සැළසුම් කිරීම, පළාත් මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම, ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් සැළසුම් කිරීම ආදී කටයුතු සිදු කරන ලදී. | ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය. |
| (උ) | පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන යටතේ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල නැවත ඉදිකිරීමට 2022 වර්ෂය තුළ රු.21,210,000 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.6,810,000 ක් එනම් ගෙවීම් කර තිබියදී ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟය හා මිල ඉහළ යාම හේතුව ලෙස දක්වමින් කොන්ත්‍රාත් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීමක් මත පදනම්ව කොන්ත්‍රාත් ගිවිසුමට | 2022 වසරේ දී මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ මෙම ඉදිකිරීම සඳහා රු.25,600,000 ක ප්‍රතිපාදන වෙන් කළ අතර, ආරම්භක අත්තිකාරම (වැට් සහිත) වශයෙන් රු.4,878,090 ක් සහ පළමු බිල්පත (වැට් සහිත) රු.1,941,984 ක් උතුරු පළාත් අධ්‍යක්ෂ වෙත ලබා දී ඇත. ඒ අනුව 2022 පළමු කාර්තුව තුළ දී රු. 6,820,000 ක එනම් සියයට 32 ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි. 2022 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මගින් සිවුවන කාර්තුවට අදාළව මෙම ඉදිකිරීම සඳහා | අපේක්ෂිත කාර්යය සාධන මට්ටම ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පටහැනිව ගිවිසුමේ දෙපාර්ශවය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාපනය අංශයේ ඉංජිනේරු අත්සන් කරන ලද දිනය රහිත ලිපියක් මගින් මෙම කොන්ත්‍රාත්තුව නිම නොකර නවතා දැමීමට කටයුතු කර තිබුණි. | රු.21,210,000 ක ප්‍රතිපාදන වෙන්කළ ද, ඒ වනවිට මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා අදාළ කටයුතු සිදු කරමින් පැවතුණි.<br>උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂකගේ 2023.04.28 දිනැති ලිපියට අනුව මෙම ගොඩනැගිල්ලේ ඉතිරි කොටස ඉදිකිරීම සඳහා රු.52,980,000 ක නව ඇස්තමේන්තුවක් සකස් කර ඇත. ඒ අනුව මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ දෙවන අදියර සඳහා රු. 25,000,000 ක් සහ තෙවන අදියර සඳහා රු. 27,980,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. | |
| (ඍ) | පශු සම්පත් අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තාරා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාකාරකම යටතේ ගොවිපළ 29ක් සංවර්ධනය කිරීම සඳහා රු.510,000ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් කිසිදු ගොවිපළක් ඉදිකර නොතිබුණි. | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු සංවර්ධන ව්‍යාපෘතිය - තාරා සංවර්ධන ව්‍යාපෘතිය උතුරු මැද පළාතේ ඉල්ලීම පරිදි තාරා සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට රු.510,000 ක් වෙන් කරන ලදී. එයට අදාළව උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ විසින් පැටවුන් මිල දී ගැනීම සඳහා අත්තිකාරම් ඉල්ලා තිබූ නමුත්, ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ගොවිපළ 29 සංවර්ධනය කළ යුතුය. |
| (එ) | පශු සම්පත් අංශයේ සූකර කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පරිසර හිතකාමී සූකර ගොවිපලවල් ඉදිකිරීම යන ක්‍රියාකාරකම යටතේ ගොවිපලවල් 110ක් පිහිටුවීමට ඉලක්කගත වී තිබුණද ගොවිපලවල් 49ක් පමණක් ඉදිකර තිබුණු අතර එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 37කි. තවද ව්‍යාපෘතිය යටතේ පුහුණුවීම් සඳහා ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණය පිළිබඳව සඳහන් කිරීමෙන් තොරව ප්‍රගතිය සියයට 10ක් වශයෙන් දක්වා තිබුණි. | මෙම සංවර්ධන ව්‍යාපෘතිය 2022.04.26 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ අංක 03/2022 අනුව පිහිටුවන ලදි. 2022 ප්‍රතිසංශෝධිත අය වැය ඇස්තමේන්තුව මගින් සිව්වන කාර්තුවට මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ විය.මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු (සූකර කොටු, අපවහන පද්ධති, ජීව වායු ජනක යනාදී) සිදුකරන බැවින් දිවයිනේ පැවති ආර්ථික අර්බුදය මත උද්ගතවූ ගැටළු හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නිමකළ හැකි වූයේ ගොවිපලවල් 49 ක පමණි. ඊට අදාළ රු.8,100,000 ක් අතරින් රු.4,720,000 ක් චෙක්පත් මගින් පියවා ඇති අතර රු. 3,420,000 ක චෙක්පත් සඳහා 2023 වර්ෂයේ ගෙවීම් සිදුකර ඇත. | ඉදිනොකළ පරිසර හිතකාමී සූකර ගොවිපලවල් 61 ඉදිකළ යුතුය. |
| (ඒ) | පශු සම්පත් අංශයේ ඵලදායිතා වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අභිජනන කළමනාකරණය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළවල් ඇතිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ගොවිපලවල් 576 ක් ස්ථාපිත කිරීමට ඉලක්කගතව පැවතියද ඉන් ගොවිපොළවල් 100ක් එනම් සියයට 17ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | 2022 වර්ෂය ආරම්භයේ එනම්, පළමු කාර්තුව තුළ ව්‍යාපෘතිය සැළසුම් කිරීම, පළාත් අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සිදු කරන ලදී. රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධ 2022.04.26 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ අංක 03/2022 නිකුත් කරන ලදී. ඒ අනුව උක්ත ව්‍යාපෘතියෙහි කටයුතු තාවකාලිකව අත්හිටුවන ලද අතර නැවතත් මෙම ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ වූයේ 2022 වර්ෂයේ ඔක්තෝබර් මස දී ය.<br>ඒ වන විට බොහොමයක් පළාත් අධ්‍යක්ෂවරුන් 2022 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අකමැත්ත පලකළ | ඉතිරි ගොවිපළ 476 සම්පූර්ණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතර, ඒ වන විටත් ව්‍යාපෘතිවල ප්‍රතිලාභී දායකත්වය දරා නිමකර ඇති ප්‍රතිලාභීන්ට පමණක් රජයේ දායකත්වය ලබා දෙන ලදී. මෙම කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ ඉලක්ක සාධනය කිරීමට අපහසු වූ අතර 2023 වර්ෂයේ පළමු කාර්තුව අවසාන වන විටත් 2022 වර්ෂයේ ව්‍යාපෘතිය යටතේ ඇති කර ගත් බැදීම් සඳහා රු. 16,800,000 ක් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමට ඉතිරි වී ඇත. | |

**3.4 වෙනත් නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පැවැති රාජ්‍ය අමාත්‍යාංශ 03 ක් අහෝසි කර කෘෂිකර්ම අමාත්‍යාංශයට ඇතුළත් කර ඒවායේ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම රාජ්‍ය අමාත්‍යාංශ 03 හි පෙර වර්ෂයේ තොරතුරු අත්හැර මෙම අමාත්‍යාංශය යටතේ වූ මූල්‍ය තොරතුරු පමණක් ඇතුළත්කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් තොරතුරු පෙර වර්ෂය හා සැසඳිය නොහැකි බව නිරීක්ෂණය කෙරේ. | අහෝසි වී ගිය රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් ගිණුම් පියවිය යුතු ආකාරය පිළිබඳ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව පැවැත්වූ වැඩමුළුව මගින් උපදෙස් ලබා දෙනු ලැබූයේ සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු අදාළ වැය විෂය ශීර්ෂයට අදාළව පමණක් හෙළිදරව් කරන ලෙස ය. | තොරතුරු පෙර වර්ෂය හා සැසඳිය හැකිවන පරිදි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මුදල් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුළු සියලුම පාර්ශවයන්හි එකඟතාවය ඇතිව ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි අධ්‍යක්ෂවරයා විසින් 2009 ජූනි 26 දින රසායනික පොහොර ගෙන්වීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් අංක 4/5/6 Quality දරන ලිපිය නිකුත් කර තිබුණි. එහෙත් 2020 මාර්තු 19 දින සිට උක්ත 4/5/6 Quality ලිපිය තුළ ඇතුළත් ක්‍රමවේදය හා එතෙක් රසායනික පොහොර පරීක්ෂා කර අනුමැතිය ලබාදුන් ක්‍රමවේදය වෙනස්කර රසායනික පොහොර අලෙවි කිරීම සඳහා වෙළඳ අනුමැතිය ලබාදී තිබුණි. එසේ වෙළඳ අනුමැතිය | | |

| | | | |
|---|---|---|---|
| | ලබාදුන් අවස්ථා පිළිබඳ සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 12 (1) (ඈ) හා 12 (2)(1) වගන්ති ප්‍රකාරව ආනයනික පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණයකින් තොරව කොරෝනා වසංගත කාලය තුළ පොහොර නැව්ගත කරන අවස්ථාවේ ලබාගත් රසායනාගාර විශ්ලේෂණ වාර්තා මත පදනම්ව වෙළඳපොළට පොහොර නිකුත් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය පරිදි ආනයනික පොහොර ශ්‍රී ලංකාව තුළ බෙදා හැරීමට අනුමැතිය ලබාදෙන බව දන්වමින් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් සියලුම ආනයනික පොහොර සමාගම් වෙත 2020 මාර්තු 20 දිනැති අංක 7/1/2/3/4 NFP දරන ලිපියක් නිකුත් කර තිබුණි. | 2020.03.03 අතිගරු ජනාධිපතිතුමා සමඟ පැවති රැස්වීමේ දී ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් එම යල කන්නයේ වී වගාව සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය රට තුළ නොමැති බව ප්‍රකාශ කරන ලද අතර 2020.03.05 වන දින "පොහොර හිඟය මඟහරවා ගැනීම සඳහා පිළියම්" යන මැයෙන් මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මගින් අතිගරු ජනාධිපතිතුමා වෙත අංක. 7/1/3/1 දරන ලිපිය මගින් කරුණු වාර්තා කර ඇත.<br>තවද මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මගින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සභාපති වෙත 2020.03.11 දින 7/1/2/3/4/NFP දරන ලිපිය මගින් රට තුළට ආනයනය කළ වෙළඳ අනුමැතිය ලබා නොදුන් මෙ.ටො. 17,000 ක පමණ සෘජු පොහොර සඳහා එක්සත් රාජධානියේ /යුරෝපා සංගමයේ පිළිගත් ප්‍රමිතීන් මත කටයුතු කර Covid 19 වසංගත තත්ත්වය හමුවේ ආහාර සුරක්ෂිතතාවය සඳහා අවශ්‍ය පියවර ගැනීම පිළිබඳව සාකච්ඡා කර ඇත.<br>Covid 19 වසංගත තත්ත්වය හමුවේ ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සාම්පල විශ්ලේෂණය කරනු ලබන රසායනාගාර වසා දමා තිබූ අතර සාම්පල ලබා ගැනීමට අදාළ සමාගම්වල ගබඩා වෙත යාම දුෂ්කර සහ අවධානම් වී තිබීමත් හමුවේ ආයතන ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂවරයා විසින් රට තුළ ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම සඳහා අඛණ්ඩව පොහොර බෙදාහැරීමට පනතේ ප්‍රකාරව පියවර ගෙන ඇත. එනම්, ජනාධිපති ලේකම් විසින් ප්‍රකාශයට පත් කරන ලද ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2020.03.19 වන දින මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත සහනාධාර ලෙස රසායනික පොහොර ගෙන්වන සියලුම සමාගම් වෙත අංක.7/1/2/3/4/NFP හා 2020.03.20 දින අන්තර්ජාතික ප්‍රතීතකරණය කරන ලද රසායනාගාර මගින් ලබාගන්නා ලද විශ්ලේෂණ වාර්තා මත වෙළඳ අනුමැතිය | පොහොර නිකුත්කිරීමට පෙර පනත ප්‍රකාරව පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලබා දී පොහොර බෙදාහැරීම සඳහා වූ ක්‍රමවේදය සකස් කර ක්‍රියාත්මක කරන ලදී. | |
| (ii) | 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 20 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශිත ප්‍රමිතීන් පවතිනවිට එම ප්‍රමිතිවලට අනුකූලව පොහොර සාම්පල විශ්ලේෂණය කළ යුතු වුවත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූල නොවන යුරෝපා ප්‍රමිතීන්ට අනුකූලවන TSP පොහොර වෙළඳපොළට නිකුත්කළ හැකි පොහොර ලෙස සලකන බවත් එවැනි තොග වෙළඳපොළට නිකුත් කිරීමට අනුමැතිය ලබාදෙන බවට සඳහන් කරමින් “TSP පොහොර සඳහා අනුමැතිය” මැයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් 2020 මාර්තු 20 වන දින අංක 7/1/2/3/4/NFP දරන ලිපියක් සියලු පොහොර සමාගම් වෙත නිකුත් කර තිබුණි. | ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) පොහොරවල බැරලෝහ පරාමිතීන් සඳහා එක්සත් රාජධානියේ / යුරෝපා සංගමයේ ප්‍රමිතීන් අනුගමනය කිරීමටත් අඩංගු බැර ලෝහ ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා මිශ්‍රණ ලෙස සකස් කර පොහොර බෙදාහැරීමටත් සියලුම ආනයනය හා බෙදාහැරීම් කරන රසායනික පොහොර සමාගම් වෙත අංක. 7/1/2/3/4/NFP හා 2020/03/20 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. | පනත ප්‍රකාරව පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (iii) | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කර ඇති අංක 7/1/2/3/4/NFP හා 2020 මාර්තු 20 වන දිනැති ලිපිය පදනම්කර ගනිමින්, ශ්‍රී ලංකාවට පොහොර තොග ආනයනය කළ පසු නියැදි පරීක්ෂාවක් මගින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් හඳුන්වාදී ඇති ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කර ගැනීමකින් තොරව, රසායනික පොහොර නැව්ගත කිරීමේදී ලබා ගන්නා විශ්ලේෂණ වාර්තාව පමණක් සැලකිල්ලට ගෙන රසායනික පොහොර මෙට්‍රික් ටොන් 245,448 ක් ශ්‍රී ලංකාව තුළ භාවිතය සඳහා අනුමැතිය ලබාදී තිබුණි. | ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) පොහොරවල බැරලෝහ පරාමිතීන් සඳහා එක්සත් රාජධානියේ / යුරෝපා සංගමයේ ප්‍රමිතීන් අනුගමනය කිරීමටත් අඩංගු බැර ලෝහ ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා මිශ්‍රණ ලෙස සකස් කර පොහොර බෙදාහැරීමටත් සියලුම ආනයනය හා බෙදාහැරීම් කරන රසායනික පොහොර සමාගම් වෙත අංක. 7/1/2/3/4/NFP හා 2020/03/20 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.එහෙත් Covid 19 වසංගතය පැතිරීම හමුවේ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් බොහෝ අංශ වසා දමා තිබූ මොහොතක අඛණ්ඩව සේවාවන් සැපයීම පවත්වා ගැනීම තුළින් ජාතික පොහොර ලේකම් කාර්යාලය දැඩි පරිශ්‍රමයක් ගෙන ගොවි ජනතාවට අවශ්‍ය පොහොර බෙදා හැරීමට අවශ්‍ය කටයුතු කිරීම මත රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීමට හැකිවිය. | පනත ප්‍රකාරව පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා ලබා නොගෙන ක්‍රියාකළ නිළධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

**4.** **අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව තුළ අභ්‍යන්තර විගණක තනතුරක් තිබියදී 2018අංක 19 දරන ජාතික විගණන පනතේ 40(2) (1) වන උප වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාත්මක වීමේ දින සිට වර්ෂ 02 ක් නොඉක්මවන කාල සීමාවක් තුළ අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරු පුරප්පාඩුව සම්පූර්ණ කරන ලෙස පෙර පැවති පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක RDAH&EC/Ad/02/024 හා 2021.11.30,2022.01.11 දිනැති ලිපි මඟින් රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන ලේකම් වෙත ඉල්ලීම් කර ඇත. අමාත්‍යාංශ ඉල්ලීමකින් තොරව අනුමත කර තිබූ අභ්‍යන්තර විගණක තනතුර සඳහා පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රයෙන් කාර්යාල කාමරයක් ලබා දීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමෙන් එම තනතුරු පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු කර නොමැත. | පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 කද, තෘතියික අංශයේ තනතුරු 06 කද, ප්‍රාථමික අංශයේ තනතුරු 20 ක ඌනතාවයක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 80 ක අතිරික්තයක්ද නිරීක්ෂණය වේ. | සියලු තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ පරිපාලන බලධාරීන් දැනුවත් කර ඇත. එමෙන්ම පුරප්පාඩු වී පවතින දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා ද බඳවා ගැනීම් ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 ප්‍රකාරව සිදු කළ නොහැක.<br>ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PS/GT/2020(IIIවෙළුම) සහ 2022.01.03 දිනැති රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 ලිපිය මගින් නිලධාරි අතිරික්තය නොසලකා නවක සංවර්ධන නිලධාරීන් ස්ථානගත කිරීමට කටයුතු කරන ලෙස දන්වන ලද බැවින් එම නිලධාරීන් සියලුදෙනා සේවා ස්ථාන වෙත අනුයුක්ත කරන ලදී. ඒ අනුව ද්වීතියික මට්ටමේ තනතුරු අතිරික්තයක් පවතී. | පුරප්පාඩු පිරවීමට හෝ වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | පොහොර අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 19 කද, තෘතියික මට්ටමේ තනතුරු 03 කද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 කද ඌනතාවයන් නිරීක්ෂණය වූ අතර ද්විතියික මට්ටමේ තනතුරු 269 ක අතිරික්තයක්ද නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය පොහොර අංශය වෙනුවෙන් (පෙර පැවති කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්,ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය) තනතුරු අනුමත වී ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අංක DMS/SM/47 හා 2021.10.04 දිනැති ලිපිය මගින් ය.ඒ අනුව, කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අංක හා 2021.10.04 දිනැති ලිපිය මගින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 31 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 03 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 31 ක්ද, ද්වීතියික මට්ටමේ තනතුරු 548 ක්ද, වශයෙන් තනතුරු අනුමත වී ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ ජොෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 30 ක් අතුරෙන් ප්‍රධාන තනතුරු කීපයක් වන අධ්‍යක්ෂක (සැලසුම්) තනතුර හා සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ (ඉංජිනේරු) හා සහකාර ලේකම් යන තනතුරු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බඳවා ගැනීම් සිදුකර නොතිබිණි. තවද පශු සම්පත් අංශයේ තෘතියික මට්ටමේ තනතුරු වන පරිපාලන කටයුතු මනාව ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිපාලන නිලධාරි තනතුර පුරප්පාඩු ව පැවතුණි. තවද ද්විතියික මට්ටමේ ඌන සේවක සංඛ්‍යාව 21 ක් ද නිරීක්ෂණය විය.<br><br>අංක 2/ 2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම ඇතුළත් වන පරිදි මානව සම්පත් සැලැස්ම පිළියෙල කළයුතු වුවත් පුහුණු කාලපරිච්ඡේදය සහ අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දෙමින් එම මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අධ්‍යක්ෂ (සැලසුම්) - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරෙහි සිටි නිලධාරිනිය 2022.12.28 දින සේවයෙන් පසු අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කර ඇත.<br>සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ lll/ll ශ්‍රේණියේ තනතුර මෙම අංශය සඳහා තවදුරටත් අවශ්‍ය නොවන බැවින් එම තනතුර අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ගන්නා මෙන් 2022.12.23 දිනැති ලිපියෙන් ඉල්ලා ඇත.<br>අධ්‍යක්ෂ (ඉංජිනේරු) - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ තනතුර සඳහා මෙතෙක් නිලධාරියෙකු පත් කර නොමැත. මෙම අංශයේ විෂයය ක්ෂේත්‍රයට, එම තනතුරට අදාළව සැලකිය යුතු මට්ටමේ කාර්යයන් ඇතුළත් නොවීම ඊට හේතු වී ඇත. ඒ බව අංක MREA/2/2/9/1-1 හා 2020.09.18 දිනැති කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇත. ඉදිරියේදී මෙම තනතුර යටපත් කිරීමට යෝජිතව ඇත.<br>සහකාර ලේකම් (ශ්‍රී ලංකා පරිපාලන සේවය - lll/ll ශ්‍රේණිය) තනතුරු පුරප්පාඩුව පවතින බව මාගේ අංක MREA/2/2/9/25(ll) හා 2020.06.25 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතද, අංක SML/2/2/ශ්‍රී.ලං.ප.සේ (පොදු) හා 2020.09.30 දිනැති ලිපිය මඟින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතද මෙයට පෙර වාර්තා කර ඇත.<br>තෘතීය මට්ටමේ පරිපාලන නිලධාරි තනතුරට නිලධාරියෙකු පත් නොකිරීම මඟින් පරිපාලන කටයුතු විධිමත් කිරීමට බාධා ඇති වන නිසා එම තනතුර පුරප්පාඩුව පවතින බව MREA/2/2/9/25(ll) සහ 2020.06.25 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇතත් මෙතෙක් එම තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර නැත.<br>ඉදිරිපත් කර ඇති විගණන විමසුමෙහි ද්වීතීයික මට්ටමට අදාළ කාර්ය මණ්ඩල තොරතුරු 2021.12.31 දිනට පහත පරිදි නිවැරදි විය යුතුය. ඒ අනුව 2021 වර්ෂයේ ද්විතීයික මට්ටමේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 21 කි. | පුරප්පාඩු පිරවීමට හෝ වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශයේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 83 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 188 ක් විය. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවාගැනීම් සිදුකර තිබුණි. | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවතීම හා රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය පුළුල් වීම මත මෙම අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශයේ අතිරේක ලේකම්ගේ අංක RDAH/DP/05/006 හා 2021.10.12 දිනැති ලිපියෙන් උපධිධාරීන් 375ක් අවශ්‍ය බව දන්වා ඇති බැවින් පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක | වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | RDAH&EC/Ad/02/014 හා 2021.10.14 දිනැති ලිපියෙන් උපාධිධාරීන් 484ක් අවශ්‍ය බව දන්වා යවන ලදී. ඒ අනුව මෙම අමාත්‍යාංශය වෙත නිලධාරීන් 116 දෙනෙක් 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුයුක්ත කරන ලදී. එතෙක් අංශය තුළ සේවය කරන ලද, 2020 උපාධිධාරී සේවක අවශ්‍යතාව අනුව බඳවා ගත් හා ආර්ථික මධ්‍යස්ථාන වල සේවය කරන සංවර්ධන නිලධාරීන් ඇතුළත් 2022.12.31 දිනට ග්‍රාමීය ආර්ථික අංශයේ සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 157කි. | |
| (ඉ) | ග්‍රාමීය ආර්ථික අංශයේ 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පැවතුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2022 හි විධිවිධාන අනුව 2022.12.31 දින සිට විශ්‍රාම ගන්නා ලදී.<br>ප්‍රධාන ගණකාධිකාරී තනතුරේ පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගණකාධිකාරීවරයෙකු පත් කර ඇත.<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරවන ලෙස එවකට පැවති පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක RDAH&EC/Ad/02/023 හා 2022.01.11 දිනැති ලිපියෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.<br>රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ අංශයක් වශයෙන් ක්‍රියාකිරීම තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාමේදී ග්‍රාමීය ආර්ථික අංශය සඳහා අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරු ඇතුළු තනතුරු 11 ක් යටපත් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | ග්‍රාමීය ආර්ථික අංශයේ ද්විතියක මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරු සඳහා අනුමත සේවක සංඛ්‍යාව 28 ක් වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 157 ක් විය. මේ අනුව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සංවර්ධන නිලධාරීන් 129 ක් බඳවාගෙන තිබුණි. | එවකට පැවති පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මේවන විට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ආර්ථික අංශය ලෙස ක්‍රියාත්මක වේ. ඉහත අනුමත සංඛ්‍යාව ඉක්මවා අනුමත කළ සංවර්ධන නිලධාරීන් අතුරින්, මේ වන විට අංශය යටතේ සේවය කරන සංවර්ධන නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |